**සෞඛ්‍ය සහ වෛද්‍ය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2019**
-----------------------------------------------------------------

**සෞඛ්‍ය සහ වෛද්‍ය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන මුල් ගිණුම් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු 2017 නොවැම්බර් 30 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය අතර පවත්වන ලද සාකච්ඡා සටහනේ ඇමුණුම II හි 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.**

**1.2 ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**
-------------------------------------------------------------------------------

**ණය ගිවිසුමට අනුව, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය දැනට සෞඛ්‍ය අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. තෘතීයික රෝහල්වල වෛද්‍ය පහසුකම් සහ උපකරණ සහ ඒ ආශ්‍රිත පහසුකම් වැඩිදියුණු කිරීම මඟින් බෝ නොවන රෝග, විශේෂයෙන් හෘද කන්තුකවාහිනී රෝග හඳුනාගැනීම සහ ප්‍රතිකාර කිරීම සඳහා වන වෛද්‍ය සේවාව වැඩිදියුණු කිරීම සහ එමඟින් ව්‍යාපෘති ක්ෂේත්‍රයේ ජනතාවගේ සෞඛ්‍යය නංවාලීමට දායක වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම සහ සාකච්ඡා සටහන් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 16,559 ට සමාන වූ ජපන් යෙන් මිලියන 11,352 ක් වන අතර ඉන් රු. මිලියන 15,519 කට සමාන වූ ජපන් යෙන් මිලියන 10,639 ක් සැපයීම සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු. මිලියන 1,040 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තුවේ. ව්‍යාපෘතියේ කටයුතු 2018 ඔක්තෝම්බර් 20 වන දින ආරම්භ කරන ලද අතර 2025 ඔක්තෝම්බර් 20 දින වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.**

**1.3 මතය**
-------

**ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.4 මතය සඳහා පදනම**
------------------------

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**
----------------------------------------------------------------------------------

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.**

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම /විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2.2.8 ඡේදය | චක්‍රලේඛ උපදෙස් අනුව වයස අවුරුදු 67 ට වැඩි ව්‍යාපෘති සේවකයින් ව්‍යාපෘතියේ සේවය සඳහා බඳවා නොගත යුතුය. කෙසේ වෙතත්, ව්‍යාපෘති කාලය අවසානය වන විට වයස අවුරුදු 69 සම්පූර්ණ වන සේවකයෙකු ව්‍යාපෘතියට බඳවාගෙන තිබුණි. | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරයකු තෝරා ගැනීම සඳහා වූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එකී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් එම චක්‍රලේඛයේ දක්වා ඇති සීමාවන්ට වඩා එම තනතුර සඳහා සුදුසුකම් සහ පළපුරුද්ද සලකා බලන ලදී. | ව්‍යාපෘතිය චක්‍රලේඛයේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතුවල භෞතික ප්‍රගතිය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපලේඛනයට අනුව (Project Implementation Schedule), ව්‍යාපෘතිය සඳහා උපදේශන සේවාවක් තෝරා ගැනීම 2018 දී අවසන් කිරීමට නියමිතව තිබුණු නමුත් උපදේශන සේවාව සඳහා කොන්ත්‍රාත්තු අත්සන් කිරීම 2020 පෙබරවාරි 18 දක්වා ප්‍රමාද වී තිබුණි. මේ හේතුවෙන් ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත ඉදිකිරීම් සහ ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වී තිබුණු අතර එය සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 659.48 ක ණය ප්‍රමාදයකටද හේතු වී තිබුණි. | අවසාන් සාකච්ඡා සටහනෙහි සඳහන් ක්‍රියාත්මක කිරීමේ උපලේඛනය ව්‍යාපෘතියේ සත්‍ය ක්‍රියාත්මක කිරීම පිළිබිඹු නොකරයි. එය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ව්‍යුහය පිළිබඳ තොරතුරු ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (JICA) හරහා ජපන් රජයට ලබාදීමට පිළියෙල කර තිබුණි. "Preparatory Survey" නමින් හඳුන්වන ලේඛනය සකස් කළ ජපන් කණ්ඩායම විසින් එම තාවකාලික උපලේඛනය 2016 සහ 2017 කාලපරිච්ඡේදය තුළ සකස් කර තිබුණු අතර එය ජපානයේ ටෝකියෝ හි "JICA Appraisal Mission" විසින් තහවුරු කරන ලදි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ උපලේඛණට අනුව ව්‍යාපෘති කටයුතු කඩිනමින් ඉටුකිරීමට පියවර ගත යුතුය. |

**3.2 ඌන උපයෝජිත සම්පත්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රජය විසින් ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 40 ක මුදලක් ලබා දී තිබුණ ද, ව්‍යාපෘතිය විසින් රු. මිලියන 14.58 ක හෝ සියයට 36 කට වඩා අඩු මූල්‍ය කාර්යසාධනයක් ලබා කරගෙන තිබුණි. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් උපදේශන සේවා සඳහා ලංසුකරුවන් ඇගයීම අවසන් කරන ලද අතර උපදේශනය සඳහා ටෙන්ඩරය 2019 නොවැම්බර් මාසයේදී ප්‍රදානය කිරීමට අපේක්ෂා කරන ලදී. අවාසනාවකට, ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලයේ විභාග සඳහා සහ නීතිපති දෙපාර්තමේන්තුවෙන් නීතිමය නිෂ්කාශන ලබා ගැනීම සඳහා ද කාලය ගතවීම හේතුවෙන් උපදේශන කොන්ත්‍රාතුව ප්‍රදානය කිරීම 2020 පෙබරවාරි දක්වා ප්‍රමාද විය. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපලේඛණයට අනුව ව්‍යාපෘති ක්‍රියාකාරකම් නියමිත වේලාවට ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |